// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2182/36 - 2020 ජූලි මස 01 වැනි බදාදා - 2020.07.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ගුරු උපදේශක සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2019.08.22 දින අනුමත කරන ලද ගුරු උපදේශක සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දක්වනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ලේකම්,

රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2020 ජූලි මස 01 වැනි දින.

1A - G32423 - 18 (2020/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

01. **ක්‍රියාත්මක වන දිනය :**

මෙම සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2020.07.01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතුය.

02. **පත්කිරීම් බලධරයා :**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

03. **සේවා ගණය/ සේවා ගණ :**

3.1. සේවා ගණය: ගුරු උපදේශක සේවය

3.2. ශ්‍රේණි

2 පන්තිය

1 පන්තිය

04. **සේවාවේ පොදු කාර්යයභාරය :**

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූල වන පරිදි රේඛීය හා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයන්හි පාලනය යටතේ අධ්‍යාපන කලාපයේ /කොට්ඨාසයේ අදාළ විෂය පිළිබඳ විශේෂඥයින් ලෙස කටයුතු කරමින් විෂය නිර්දේශ හා පෙළපොත් ආශ්‍රිතව ගුරුවරුන් දිශාභිමුඛ කිරීම, කලාපයේ / කොට්ඨාසයේ ගුරු පුහුණු අවශ්‍යතා හඳුනා ගනිමින් ගුරුවරුන් පුහුණු කිරීම සඳහා අවශ්‍ය කාර්යයන් ක්‍රියාත්මක කිරීම, ජාතික පර්යේෂණ හා ඇගයීම් කටයුතු ක්‍රියාවලියේදී සක්‍රියව දායකවීම හා කලාපයේ / කොට්ඨාසයේ තම විෂයට අදාළ අධ්‍යාපන ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා සුසාධ්‍යකරණය කිරීම

05. **වැටුප් :**

5.1. ***වැටුප් කේත අංකය***

ජී.ඊ. 3 – 2016

5.2. ***වැටුප් පරිමාණය***

රු. 34,615 - 3×680 - 7×1,335- 20×1,400 - 74,000/=

5.3. ***පන්ති ක්‍රමය හා අදාළ වැටුප් ක්‍රමය***

| *පන්තිය* | *වැටුප් පියවර* | *ආරම්භක වැටුප* |
|---|---|---|
| 2 පන්තිය | 1 පියවර | රු. 34,615 |
| 1 පන්තිය | 11 පියවර | රු. 46,000 |

06. **සේවයට අයත් තනතුරු :**

6.1.

| *අනුමත තනතුරු නාම* | *ශ්‍රේණිය* | *අනුමත තනතුරු සංඛ්‍යාව* |
|---|---|---|
| ගුරු උපදේශක | II/I | 4471 |

*සටහන* : එක් එක් විෂය සහ පළාත් අනුව අනුමත සේවක සංඛ්‍යාව පිළිබඳව තොරතුරු "අ" උපලේඛනය යටතේ ඇතුළත් කර ඇත.

6.2. ***ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව - 4471***

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා II හා I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

6.3 ***තනතුරු වල ස්වභාවය*** :- ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත
(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතු වේ.)

07. **බඳවා ගැනීමේ ක්‍රමය**

7.1. ***බඳවා ගන්නා ප්‍රතිශතය***

| *ධාරාව* | *ප්‍රතිශතය* |
|---|---|
| විවෘත | අදාළ නොවේ |
| සීමිත | 100% |
| කුසලතා | අදාළ නොවේ |

7.2. ***සීමිත බඳවා ගැනීම.***

7.2.1. *බඳවා ගන්නා ශ්‍රේණිය* :

ගුරු උපදේශක සේවයේ 2 පන්තිය

7.2.2. *සුදුසුකම්* :

පහත සඳහන් සුදුසුකම් සහිත රජයේ පාසල්වල සේවය ස්ථිර කරන ලද, ශ්‍රී ලංකා ගුරු සේවයේ 1 පන්තියේ හෝ 2 – 1 පන්තියේ සේවය කරන ගුරුවරු සීමිත තරඟ විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබති.

7.2.2.1 *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්* :

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනය මගින් නියමිත විෂයය පිළිබඳව ලබාගත් උපාධිය සහිත ගුරුවරයෙකු වීම ;

*හෝ*

ii. නියමිත විෂයය පිළිබඳව ගුරු පුහුණු සහතිකය හෝ නියමිත විෂයය පිළිබඳව ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සහිත ගුරුවරයෙක් වීම ;

*හෝ*

iii. අදාල විෂයය යටතේ “ආ” උපලේඛනයේ දක්වා ඇති සුදුසුකම් සහිත ගුරුවරයෙකු වීම එක් එක් විෂයයට අදාල අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් “ආ” උපලේඛනයේ ඇතුලත් කර ඇත.

7.2.2.2 *පළපුරුද්ද* :

ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරයෙකු ලෙස අදාළ විෂයය ඉගැන්වීම පිළිබඳව වසර 10 කට නොඅඩු පළපුරුද්දක් සහිත වීම.

7.2.2.3 *කායික සුදුසුකම්* :

සෑම අපේක්ෂකයකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

7.2.2.4 *වෙනත්* :

i. තනතුරෙහි ස්ථිර කර තිබිය යුතුය.

ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව දඬුවමක් ලබා නොතිබිය යුතුය.

iii. ගුරු උපදේශක සේවයට බඳවා ගැනීම සඳහා පවත්වන තරග විභාගය සඳහා පෙනී සිටිය හැකි උපරිම වාර ගණන තුන (3) කි.

iv. ගුරු උපදේශක සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට ගැසට් නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 *වයස* :

7.2.3.1 අවම සීමාව- අදාළ නොවේ

7.2.3.2 උපරිම සීමාව - අවුරුදු 50

7.2.4 *බඳවා ගැනීමේ ක්‍රමය* :

7.2.4.1 *ලිඛිත විභාගය* :

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. ප්‍රායෝගික අධ්‍යාපන මනෝ විද්‍යාව, අධ්‍යාපන කළමනාකරණය, නූතන අධ්‍යාපන ව්‍යවහාර ආශ්‍රිතව සිද්ධි අධ්‍යයනයක් | 100 | 40% |
| 2. විෂය ක්ෂේත්‍රයට අදාළ ප්‍රවීණතාව | 100 | 40% |

7.2.4.1.1 *පවත්වන බලධරයා* - විභාග කොමසාරිස් ජනරාල් හෝ අධ්‍යාපන ලේකම් විසින් නම් කරනු ලබන ආයතනයක්.

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය - අදාළ නොවේ.

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය - අදාළ නොවේ

7.2.4.4 යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

| *ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| **I කොටස** | | |
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාළ නොවේ. |
| 2. ගුරු වෘත්තියේ ලබා ඇති පළපුරුද්ද | 15 | |
| 3. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව | 10 | |
| 4. තොරතුරු සන්නිවේදන තාක්ෂණ කුසලතාව | 10 | |
| **II කොටස ප්‍රායෝගික පරීක්ෂණය** | | |
| 1. ප්‍රායෝගික ඉගැන්වීමේ කුසලතාව ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේද | 100 | 60 |

*සටහන :*

1. ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, එක් එක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා වන විස්තරාත්මක ලකුණු පරිපාටිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කර අයදුම්පත් කැඳවීමේ නිවේදනයට ඇතුළත් කර ප්‍රසිද්ධ කරනු ලැබේ.

2. ලිඛිත පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර එම සියලුම අයදුම්කරුවන් සඳහා ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වනු ලැබේ. යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදීම මූලික සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

3. ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය ලබා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේ දී හා යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ඇති ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් ගුරු උපදේශක තනතුරට පත්කරනු ලැබේ.

7.2.4.4.1 යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා :-
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින්

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය: රජයේ *ගැසට් පත්‍රයේ* දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

08. **කාර්යක්ෂමතා කඩඉම**

8.1

| *කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද?* | *කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත්* |
|---|---|---|
| පළමු වන කාර්යක්ෂමතා කඩඉම | ගුරු උපදේශක සේවයේ 2 පන්තියට බඳවා ගැනීමෙන් වසර පහ (5) ඉක්මවීමට පෙර | පර්යේෂණ නිබන්ධනය ("ආ"පරිශිෂ්ටය බලන්න) |

8.2 කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද -
වසරකට දෙවරක් පැවැත්වේ.

8.3 කාර්යක්ෂමතා කඩඉමට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන පවත්වන බලධරයා කවුරුන්ද
1 වන කාර්යක්ෂමතා කඩඉම :අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්

09. **භාෂා ප්‍රවීණතාව**

9.1

| *භාෂාව* | *ලබාගත යුතු ප්‍රවීණතාව* |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂාවකින් සේවයට බඳවා ගත් නිලධාරියෙකු තනතුරෙහි ස්ථිර කිරීමට පෙර එක් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාව ලබා ගත යුතු ය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතු ය. |
| සන්ධාන භාෂාව | සේවයේ සෑම නිලධාරියෙකුම බඳවා ගැනීමේ දින සිට වසර තුන (3) ඇතුළත සන්ධාන භාෂාව වන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබාගත යුතුය. නිලධාරියකු අ.පො.ස.(සා.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයය සඳහා සම්මාන සාමර්ථයක් හෝ ඊට ඉහළ සාමර්ථයක් ලබා තිබේ නම් ඉංග්‍රීසි භාෂා පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවෙන් නිදහස් කරනු ලැබේ. සෙසු නිලධාරීන් මෙහි "ඇ" පරිශිෂ්ටයේ සඳහන් පරීක්ෂණය සමත් විය යුතුය. |

10. **ශ්‍රේණි උසස් කිරීම**

10.1 සේවයේ 2 වන පන්තියේ සිට 1 වන පන්තියට උසස් කිරීම

10.1.1 *සපුරාලිය යුතු අවශ්‍යතා* :

i. උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට සේවයේ 2 වන පන්තියේ අවම වශයෙන් වසර දහය (10)ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබිය යුතුය.

ii. පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබිය යුතුය.

iii. අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටි අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්නයේ වූ වසර දහය (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබිය යුතුය.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව දඬුවමක් ලබා නොතිබිය යුතුය.

v. සන්ධාන භාෂා ප්‍රවීණතාව ලබා තිබීම.

vi. අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා තිබීම හෝ ඉන් නිදහස් කර තිබීම.

10.1.2. *උසස් කිරීමේ ක්‍රමය* :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරීන් විසින් පත් කිරීමේ බලධරයා වෙත ඉල්ලුම් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි 1 වන පන්තියට උසස් කිරීම පත්වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ. ඉල්ලුම් කළයුතු ආකෘති පත්‍රය “ඉ” පරිශිෂ්ටයේ දක්වා ඇත.

11. *තනතුරුවලට පත්කිරීම* :- එක් එක් පළාත සඳහා අනුමත සංඛ්‍යාව අනුව ගුරු උපදේශක සේවයේ නිලධාරීන් පළාත් රාජ්‍ය සේවයේ තනතුරුවලට පළාත් අධ්‍යාපන බලධාරීන්ගේ එකඟතාවය සහිතව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් මුදාහරිනු ලැබේ. නිලධාරීන් පළාත් රාජ්‍ය සේවය තුළ ස්ථාන ගත කිරීම සහ පළාත තුළ ස්ථාන මාරු කිරීම පළාත් අධ්‍යාපන බලධාරයා විසින් සිදුකරනු ලැබේ.

12. **සේවයට අදාළ කොන්දේසි**

12.1. සේවයට බඳවා ගන්නා නවක නිලධාරීන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් නියම කරනු ලබන ආයතනයකදී පවත්වනු ලබන සේවාරම්භක පුහුණු ව සම්පූර්ණ කර සහතික පත්‍රය ලබාගත යුතුය.සේවාරම්භක පුහුණුව සම්පූර්ණ කිරීමට අසමත්වන නිලධාරීන් කලින් දැරූ තනතුරුවලට ආපසු යැවීම හෝ සේවය අවසන් කිරීම සිදුකරනු ලැබේ.

12.2. බඳවාගනු ලබන සෑම නිලධාරියෙක්ම ඉහත 12.1 හි සඳහන් විධිවිධාන ,ආයතන සංග්‍රහයේ හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල සඳහන් විධිවිධානවලට යටත්ව එක් අවුරුදු වැඩ බැලීමේ කාල සීමාවකින් පසුව සේවය ස්ථිර කරනු ලැබේ.

13. **නිර්වචන**

13.1. “ව්‍යවස්ථාව” යනුවෙන් ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය අදහස් කෙරේ.

13.2. “කොමිෂන් සභාව” යනුවෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54 වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පත් කරනු ලබන රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

13.3. වෙනත් අයුරකින් සුවිශේෂී කොට සඳහන් කර නැත්නම් “සේවය” යනුවෙන් ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවය අදහස් කෙරේ.

13.4. “අමාත්‍යාංශය”යන්නෙන් සාමාන්‍ය අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශය අදහස් කෙරේ.

13.5. “පළාත් අධ්‍යාපන බලධරයා” යන්නෙන් පළාත් ආණ්ඩුකාරවරයා විසින් බලතල පවරනු ලැබූ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ පළාත් ආණ්ඩුකාරවරයා විසින් බලතල පවරනු ලැබූ නිලධාරියකු අදහස් කරනු ලැබේ.

14.

14.1. ***ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :***

මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මඟින් ලබා දී ඇති ජී.ඊ.-01 හෝ ජී.ඊ.-02 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියලු දෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විවිධිධානවලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ගුරු උපදේශක තනතුරට පත්කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

ජී.ඊ.-03 - I ශ්‍රේණිය

(*අ*) ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවය වසර විස්ස (20)කට නො අඩු සක්‍රීය හා සතුටු දායක සේවා කාලයක් සහිත සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ ගුරු උපදේශක තනතුරට අදාළ රාජකාරී ඉටුකිරීම සඳහා විධිමත්ව පත්කර ඇති එම තනතුරට අදාළ වසර දහය (10) කට නොඅඩු සේවා පළපුරුද්දක් සහිත ගුරුභවතුන් ගුරු උපදේශක සේවයේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(*ආ*) ගුරු උපදේශක සේවයේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන්ගේ ශ්‍රී ලංකා ගුරු සේවයේ වසර විස්ස (20) ක සක්‍රීය හා සතුටු දායක සේවා කාලය සහ ගුරු උපදේශක තනතුරට අදාළ රාජකාරී ඉටු කිරීම සඳහා විධිමත්ව පත්කර වසර දහය (10)ක සේවා පළපුරුද්ද සම්පූර්ණ කරනු ලබන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට වන ගුරු උපදේශක තනතුරේ පළපුරුද්ද සහිත සක්‍රීය හා සතුටුදායක සේවා කාලය II ශ්‍රේණියේ සේවා කාලයක් ලෙසට සලකනු ලැබේ.

ජී.ඊ.-03 - II ශ්‍රේණිය

(*අ*) ඉහත අනු අංක හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර නොමැති ශ්‍රී ලංකා ගුරු සේවයේ වසර දහය (10) කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ ගුරු උපදේශක තනතුරට අදාළ රාජකාරී ඉටුකිරීම සඳහා විධිමත්ව පත්කර ඇති ගුරුභවතුන් ගුරු උපදේශක සේවයේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(*ආ*) ගුරු උපදේශක සේවයේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන්ගේ ගුරු උපදේශක තනතුරට අදාළ රාජකාරී ඉටුකිරීම සඳහා විධිමත්ව පත්කර ඇති දිනය හෝ ශ්‍රී ලංකා ගුරු සේවයේ වසර දහය (10) ක සක්‍රීය හා සතුටු දායක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට වන ගුරු උපදේශක තනතුරේ පළපුරුද්ද සහිත සක්‍රීය හා සතුටුදායක සේවා කාලය II ශ්‍රේණියේ සේවා කාලයක් ලෙසට සලකනු ලැබේ.

14.2. ***අන්තර්ග්‍රහණ කොන්දේසි :***

සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන සියලුම නිලධාරීන් සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනයේ සිට වසර පහ (05) ක කාලයක් තුළ 8.1 යටතේ සඳහන් පළමුවන කාර්යක්ෂමතා කඩඉම සහ 9.1 යටතේ සඳහන් සන්ධාන භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කළ යුතුය.

14.3. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හෝ පළාත් ප්‍රධාන ලේකම් හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ ගුරු උපදේශක තනතුරට අදාළ රාජකාරී ඉටු කිරීම සඳහා විධිමත්ව පත්කර ඇති ගුරුභවතුන් මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින සිට මාස (06)ක කාලයක් තුළ ගුරු උපදේශක සේවයේ සේවා ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසිවලට යටත්ව අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කළ යුතුය. මනාපය පළ කිරීමට අදාළ අයදුම්පත සහිත නිවේදනයක් මෙම සේවා ව්‍යවස්ථාව *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් පසු අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබේ.

15. මෙම ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානවලට අමතරව ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ අංක 1589/30 හා 2009.02.20 දිනැතිව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට සේවයේ සෑම නිලධාරියෙක් ම යටත්වේ.

16. මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධ අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

17. අන්තර්කාලීන යෝජනා :- අදාළ නොවේ.

## " අ" පරිශිෂ්ටය

***ගුරු උපදේශක සේවයේ 2 වන පන්තියට නිලධාරීන් බඳවා ගැනීමේ තරග විභාගය පිළිබඳ විස්තර***

01. **ලිඛිත විභාගය** - ලිඛිත විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

| *විෂයය* | *කාලය* | *ලකුණු* |
|---|---|---|
| 01. ප්‍රායෝගික අධ්‍යාපන මනෝ විද්‍යාව, අධ්‍යාපන කළමනාකරණය, නූතන අධ්‍යාපන ව්‍යවහාර අශ්‍රිතව සිද්ධි අධ්‍යයනයක් | පැය 2 | 100 |
| 02. විෂය ක්ෂේත්‍රයට අදාළ ප්‍රවීණතාව | පැය 2 | 100 |

02. **විෂය නිර්දේශය :**

02.1. ප්‍රායෝගික අධ්‍යාපන මනෝ විද්‍යාව, අධ්‍යාපන කළමනාකරණ, නූතන අධ්‍යාපන ව්‍යවහාර ආශ්‍රිතව සිද්ධි අධ්‍යයනයක් (කාලය පැය -02 )

සෛද්ධාන්තික දැනුම මත පමණක්ම නොව අධ්‍යාපන උපදේශකවරුන් වශයෙන් ප්‍රායෝගික අත්දැකීම් මත තමාගේ නිර්මාණාත්මක කුසලතා, අධ්‍යාපන විෂයමාලා සමාන්තර හා සහානුකරණය මත පදනම් කරගෙන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම පහත ක්ෂේත්‍ර ආශ්‍රිත කෙටි ප්‍රශ්න සිද්ධි අධ්‍යයනය කර ඉදිරිපත් කිරීමක් කරනු ලැබිය යුතු ය.

(i) කළමනාකරණ සංකල්ප හඳුනා ගැනීම හා අධ්‍යාපන කළමනාකරණයේ පංචවිධ කාර්යභාරය

(ii) ඉගෙනුම, ඉගැන්වීම, ඇගයුම හා අධීක්ෂණ ක්‍රියාවලි, ඉහත ක්‍රියාවලියේ ගුරුවරයාගේ භූමිකාව, හා සැමට අධ්‍යාපනයේ වැදගත්කම

(iii) විශේෂ අවශ්‍යතා ඇති සිසුන් හා පන්ති කාමරයේ ව්‍යවහාර පන්ති කාමර ගැටළු විසඳීම

*උදා* :- පන්ති කළමනාකරණය, අවම සම්පත්වලින් උපරිම ලෙස ඵලදායිතාව ලබා ගැනීමේ විධි

(iv) විෂය සමගාමී ක්‍රියාකාරකම් සංවිධානය හා ක්‍රියාත්මක කිරීම

(v) ගුරු කුසලතා ඇගයීමේ ක්‍රම

(vi) අධීක්ෂණ මූල ධර්ම, අධීක්ෂණ සිදුකරන ආකාර, මුහුණපාන ගැටළු හා විසඳුම්

(vii) පාසල් විෂයමාලාවේ ස්වභාවය , විෂයමාලාව මගින් පාසල සම්බන්ධ කළ හැකි ආකාරය හා වෘත්තීය නැඹුරුව ඇති කළ හැකි අයුරු

(viii) විවිධ අධ්‍යාපන පර්යේෂණ ප්‍රවේශ, දත්ත රැස් කිරීමේ ක්‍රම හා විශ්ලේෂණය කිරීම

02.2 විෂය ක්ෂේත්‍රයට අදාළ ප්‍රවීණතාව (කාලය පැය 02)

ඉගෙනුම, ඉගැන්වීම, ඇගයුම් ක්‍රමවේද හා උපකරණ පන්ති කාමරයට අදාළ කර ගැනීම් පිරික්සීමට ලක්කරනු ඇත.

03.

03.1 මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.

03.2 අපේක්ෂකයෙකුට කැමති එක් භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය හැකිය.
(අයදුම්පතෙහි මාධ්‍ය සඳහන් කළ පසුව වෙනස් කිරීමට අවසර ලබා දෙනු නොලැබේ)

04. විභාගය පවත්වනු ලබන බලධරයා :- විභාග කොමසාරිස් ජනරාල්

05. යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී පවත්වනු ලබන ප්‍රායෝගික ඉගැන්වීමේ කුසලතාවය (ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේද හා ක්‍රම ශිල්ප) පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙන ශීර්ෂයන්

| *ලකුණු ලබා දෙන ප්‍රධාන නිර්ණායක* | *උපරිම ලකුණු* | *තෝරාගැනීමේ අවම ලකුණු* |
|---|---|---|
| 1. විධිමත් සූදානම් සටහන | 10 | 60 |
| 2. ඉදිරිපත් කිරීම | 10 | |
| 2.1 පිවිසීම | 10 | |
| 2.2 විෂය අන්තර්ගතය (මාතෘකාවට අදාළ වීම) | 10 | |
| 2.3 පාඩම සංවර්ධනය | 10 | |
| 2.4 උපකරණ භාවිතය | 10 | |
| 2.5 සමාලෝචනය හා ඇගයීම | 10 | |
| 2.6 ඉදිරි ප්‍රතිපෝෂණය | 10 | |
| 2.7 කාල කළමනාකරණය | 10 | |
| 2.8 පන්ති කළමනාකරණය | 10 | |

## “ ආ” පරිශිෂ්ටය

***ගුරු උපදේශක සේවයේ 2 වන පන්තියේ නිලධාරීන් විසින් සමත්විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ විස්තර***

01. ***පර්යේෂණ නිබන්ධනය*** :

1.1 සේවයට බඳවා ගනු ලබන හෝ අන්තර්ග්‍රහණ කරනු ලබන සෑම ගුරු උපදේශකවරයකුම අධ්‍යාපන සංවර්ධනයට අදාළව තම අධ්‍යාපන කලාපය/ කොට්ඨාසය/ පාසලක් පදනම් කරගත් යෝජනාවක් /ගැටළුවක් සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් පත්කරනු ලබන කමිටුවක් වෙත පර්යේෂණ නිබන්ධනයක් ඉදිරිපත් කළ යුතුය.

1.2 අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පර්යේෂණ නිබන්ධනය සම්බන්ධව වන නිර්ණායකයන් සකස් කර සියලුම නිලධාරීන්ගේ දැනගැනීම සඳහා ප්‍රසිද්ධ කළ යුතුය.

1.3 පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් පත්කරනු ලබන කමිටුවක් විසින් අදාළ නිර්ණායකයන්ට අනුව පර්යේෂණ නිබන්ධනය ඇගයීමට ලක්කර පිළිගත් බවට ලිපියක් නිකුත් කිරීමෙන් පසු පමණක් අදාළ ගුරු උපදේශකවරයා විසින් පර්යේෂණ නිබන්ධනයට අදාළ අවශ්‍යතාවය සම්පූර්ණ කරනු ලැබූ බවට පිළිගනු ලැබේ.

## "ඇ" පරිශිෂ්ටය

***ගුරු උපදේශක සේවය සඳහා වූ ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය***

01. ගුරු උපදේශක සේවය සඳහා වූ ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය එක් ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

    1. ඉංග්‍රීසි - ලකුණු 100

02. සාමර්ථ්‍යය සඳහා මෙම ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40% ක් ලකුණු ලබාගත යුතුය.

03. විෂය නිර්දේශය

    i. General English - Time 03 hours

Suitable level of proficiency on the following forms of grammar in the written language is expected from the candidate.

- Tenses and Numbers
- Sentences (simple/complex/compound complex)
- Relative Clauses
- Reported Speech
- Adjectives and Adverbs
- Prepositions

The Knowledge on the modern formats and styles of writing is tested in following area of Study

- Summary writing
- Report writing
- Essay writing

## "ඉ" පරිශිෂ්ටය

### ගුරු උපදේශක සේවයේ 2 වන පන්තියේ නිලධාරීන් 1 වන පන්තියට උසස් කිරීම
### ආදර්ශ අයදුම් පත්‍රය

*1 වන කොටස*

01. (අ) මුල'කුරු සමග නම:- ………………………………………………………………… මයා/මිය/මෙනවිය
(ආ) මුල'කුරු වලින් හැඳින්වෙන නම :-……………………………………………………………
(ඇ) නම් වෙනස් කලේ නම් මීට පෙර භාවිත කළ නම ……………………………………………....
(නම වෙනස්කර ඇත්නම් පමණි)
02. උපන් දිනය :- ………………………………………………………………………………
03. ජාතික හැඳුනුම්පත් අංකය :- ……………………………………………………….................
04. පෞද්ගලික ලිපිනය :- ………………………………………………………………...............
05. දැනට සේවය කරන ස්ථානය :-…………………………………………………………...............
06. දැනට දරන තනතුරු :- ......……………………………………………………………..............
07. සේවා ස්ථානය අයත් කලාපය :- …………………………………….......................................
08. සේවයේ මුල් පත්වීම් ලද පන්තිය හා දිනය :- …………………………………………...............
09. සේවයේ 2 වැනි පන්තියට බඳවා ගත් දිනය උසස්වීම් ලද දිනය :- ……………………...................
10. පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත්වූ දිනය හා විභාග අංකය :- ……………………............
11. සේවයේ 2 වන පන්තියේ වසර දහය(10) ක් සම්පූර්ණ වූ දිනය :- ……………………...................
12. උසස්වීමේ පූර්වාසන්න වසර පහ (05) තුළ පෙන්නුම් කර ඇති කාර්ය සාධන මට්ටම :- ……................

| *වර්ෂය* | *කාර්ය සාධන මට්ටම* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |

13. දෙවන භාෂාව සමත්වූ දිනය හෝ සමත්වීමේ අවශ්‍යතාවෙන් නිදහස් වූ දිනය එම ලිපියේ යොමු අංකය හා දිනය :-
.......................................................................................................
14. සන්ධාන භාෂාව සමත් වූ දිනය සමත්වීමේ අවශ්‍යතාවෙන් නිදහස් වූ දිනය, එම ලිපියේ යොමු අංකය හා දිනය :-
.......................................................................................................

මෙම අයදුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදිවූත් ඒවා බව සහතික කරමි. මෙහි සඳහන් කර ඇති තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා උසස් කිරීමට පෙර හෙළිදරවු වුවහොත් මා නුසුදුස්සකු වීමට යටත් වන බවටත් උසස් කිරීමෙන් පසු හෙළිදරවු වුවහොත් උසස් කිරීම අවලංගු කිරීමට යටත් වන බවටත් මම එකඟ වෙමි. ....................................................දින සිට ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවයේ පළමු පන්තියට උසස් කරන මෙන් ඉල්ලා සිටිමි.

දිනය....................................... ......................................................
අයදුම්කරුගේ අත්සන

*2 වන කොටස*

............................................................................. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

................................................ මහතා /මහත්මිය/ මෙනවියගේ ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදි ය.

i. ................................ දිනට දෙවන පන්තියේ වසර දහය(10) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇත/නැත.

ii. උසස්වීම් පූර්වාසන්න වසර පහ(05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇත/ නැත.

iii. එම වසර පහ (05) තුළ අඩ වැටුප්/ වැටුප් රහිත නිවාඩු ලබා ඇත / නැත.

iv. එම කාලය තුළ අවවාද කිරීමක් හැර කිසිම දඬුවමකට යටත් කර ඇත/නැත.

v. නිලධාරීන්ට / නිලධාරිනියන්ට විරුද්ධ විනය කටයුතු කිසිවක් ඇත/නැත.

vi. අදාළ කාලයට නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇත/ නැත.

vii. ............................ දින සිට පත්වීම් ස්ථිර කර ඇත / නැත.

viii. පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී ඇත /නැත.

ix. දෙවන භාෂාවෙන් සමත් වීමේ අවශ්‍යතාව සම්පූර්ණ කර ඇත /නැත.

x. සන්ධාන භාෂාවෙන් සමත් වීමේ අවශ්‍යතාව සම්පූර්ණ කර ඇත/නැත.

මෙම නිලධාරියා /නිලධාරිනිය .................................. දින සිට සේවයේ 1 වන පන්තියට උසස් කිරීමට නිර්දේශ කරමි/ නොකරමි.

දිනය :- .................................... ......................................................................

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

---

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,

මෙම නිලධාරියා /නිලධාරිනිය..................................... දින සිට සේවයේ 1 වන පන්තියට උසස් කිරීමට නිර්දේශ කරමි / නොකරමි.

දිනය :- …………………………………………… ......................................................................

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

---

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය
මෙම නිලධාරියා /නිලධාරිනිය..................................... දින සිට සේවයේ 1 වන පන්තියට උසස් කිරීමට නිර්දේශ කරමි / නොකරමි.

දිනය :- …………………………………………… ......................................................................

පළාත් අධ්‍යාපන ලේකම්

## අ උපලේඛනය

**වගු අංක 1: යෝජිත ගුරු උපදේශක සේවය සඳහා ගුරු උපදේශක අවශ්‍යතාව පළාත් අනුව.**

| පළාත | අනුමත සිංහල මාධ්‍ය ගුරු උපදේශක සංඛ්‍යාව | අනුමත දෙමළ මාධ්‍ය ගුරු උපදේශක සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|
| බස්නාහිර පළාත | 746 | 69 | 815 |
| මධ්‍යම පළාත | 414 | 222 | 636 |
| දකුණු පළාත | 505 | 05 | 510 |
| උතුරු පළාත | 05 | 377 | 382 |
| නැගෙනහිර පළාත | 96 | 370 | 466 |
| වයඹ පළාත | 466 | 74 | 540 |
| උතුරු මැද පළාත | 282 | 22 | 304 |
| ඌව පළාත | 290 | 71 | 361 |
| සබරගමු පළාත | 384 | 73 | 457 |
| **එකතුව** | 3188 | 1283 | 4471 |

**වගු අංක 2: යෝජිත ගුරු උපදේශක සේවය සඳහා අවශ්‍ය ගුරු උපදේශකවරුන් : (විෂයයන් අනුව)**

| අනු. අංක | විෂයය | යෝජිත ගුරු උපදේශකවරු සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ප්‍රාථමික | 1358 |
| 2 | ඉංග්‍රීසි | 428 |
| 3 | විද්‍යාව | 267 |
| 4 | ගණිතය | 267 |
| 5 | මවුබස | 253 |
| 6 | දෙවන බස | 119 |
| 7 | ඉතිහාසය | 164 |
| 8 | ශාරීරික අධ්‍යාපනය | 168 |
| 9 | තොරතුරු තාක්ෂණය | 146 |
| 10 | ද්වි භාෂා | 108 |
| 11 | මාර්ගෝපදේශනය | 75 |
| 12 | ගුරු පුස්තකාලයාධිපති | 34 |
| 13 | චිත්‍ර | 88 |
| 14 | පෙරදිග නර්තනය/භරත නර්තනය | 72 |
| 15 | සංගීතය පෙ/අ/ක | 65 |
| 16 | නාට්‍යය හා රංගකලාව | 110 |
| 17 | භූගෝල විද්‍යාව | 89 |
| 18 | පුරවැසි අධ්‍යාපනය | 43 |
| 19 | වාණිජ්‍ය හා ගිණුම්කරණය | 23 |
| 20 | තාක්ෂණය | 45 |
| 21 | කෘෂිකර්මය | 92 |
| 22 | ගෘහ ආර්ථික විද්‍යාව | 70 |
| 23 | විශේෂ අධ්‍යාපනය/ නොවිධිමත් අධ්‍යාපනය | 80 |
| 24 | බුද්ධාගම | 135 |
| 25 | කතෝලික ධර්මය | 38 |
| 26 | ක්‍රිස්තියානි ධර්මය | 14 |
| 27 | ඉස්ලාම් ධර්මය | 28 |
| 28 | හින්දු ධර්මය | 92 |
| **එකතුව** | | 4471 |

ආ උපලේඛනය

***අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :***

I විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනයෙන් ලබාගත් විෂයයට අදාළ ප්‍රථම උපාධිය (උපාධිය, ගුරු උපදේශක සේවයේ ඉල්ලුම් කරනු ලබන විෂයයට අදාළ විය යුතුය.)

II ප්‍රාථමික, සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය, නිර්මාණ තාක්ෂණය, ශිල්ප කලා (මැටි සහ හස්ත කර්මාන්ත), යාන්ත්‍රික තාක්ෂණය, ඉදිකිරීම් තාක්ෂණය, විදුලිය හා ඉලෙක්ට්‍රොනික් තාක්ෂණය,පේෂකර්මය, ගෘහ ආර්ථික විද්‍යාව, ලී වැඩ,ලෝහ වැඩ, විශේෂ අධ්‍යාපනය හා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වරින් වර හඳුන්වා දෙනු ලබන තාක්ෂණ විෂයයන් සඳහා පහත සඳහන් සුදුසුකම් පිළිගනු ලැබේ.

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනයෙන් හෝ අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් පිළිගනු ලබන ආයතනයක් විසින් පිරිනමනු ලබන්නා වූ එක් වසරකට නොඅඩු වෘත්තීය අධ්‍යාපන ඩිප්ලෝමාව.

***සටහන :***

ඉහත සඳහන් විෂයයන්ට අමතරව දැනට පවතින වෙනත් තාක්ෂණ විෂයයන් සම්බන්ධයෙන් හෝ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වරින් වර හඳුන්වා දෙනු ලබන නව තාක්ෂණ විෂයයන් සම්බන්ධයෙන් වූ බඳවා ගැනීමේ සුදුසුකම් අධ්‍යාපන විෂයය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත.

02. ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව (විද්‍යාපීඨ).

07 - 434

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.